**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය - 2023**

---------------------------------------------------------------------------------------------------

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (IBRD) අතර 2021 සැප්තැම්බර් 17 දිනැතිව එළඹි අංක 8996 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුමට අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපාතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ අධික බලපෑම් සහිත කාලගුණික විපර්යාස සහ ජල විද්‍යාත්මක උපද්‍රව පිළිබඳ අනතුරු ඇඟවීම් වැඩිදියුණු කිරීම සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා කැලණි ද්‍රෝණියේ බහුකාර්ය ජල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉහළ බලපෑම් සහිත කාලගුණික තත්ත්ව, ගංවතුර සහ නායයෑම් පිළිබඳ අනාවැකි කීම සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, පහළ කැලණි ද්‍රෝණියේ ගංවතුර අවදානම අවම කිරීම සඳහා ආයෝජනය කිරීම, ව්‍යාපෘති කළමනාකරණය සහ හදිසි ප්‍රතිචාර සංරචකය (CERC) යන සංරචක හතර යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 27,900 කට සමාන එ.ජ.ඩො. මිලියන 93ක් වූ අතර එම පිරිවැයෙන්, රු. මිලියන 27,600 කට සමාන එ.ජ.ඩො. මිලියන 92ක මුදල මූල්‍යකරණය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (IBRD) එකඟ විය. ඉතිරි මුදල වූ රු. මිලියන 300ක් මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. ව්‍යාපෘතියේ කටයුතු 2021 ඔක්තෝබර් 12 වන දින ආරම්භ කර තිබුණු අතර එම කටයුතු 2026 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 මතය**

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූෂ්‍යසන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| බැඳීම් ගාස්තු රු. මිලියන 72 ක් සහ සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ණය පොළිය ලෙස අය කරන ලද රු.මිලියන 33 ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ව්‍යාපෘති වියදම රු.මිලියන 105 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 105 | සාමාන්‍ය ගැළපුම් සහ පොළිය සහ බැඳීම් ගාස්තු 2022 වර්ෂය සඳහා වන ගිණුම්වලට ද ඇතුළත් කළ යුතු බව විගණනය මගින් පෙන්වා දී ඇත. ඒ අනුව, ඉදිරිපත් කරන ලද අවසන් ගිණුම් ඉවත් කර සාමාන්‍ය ගැළපීම ගිණුම්ගත කරන ලද අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ පොළිය සහ බැඳීම් ගාස්තු වෙනම සටහනක් ලෙස හෙළිදරව් කරන ලදී. පොළිය සහ බැඳීම් ගාස්තු ව්‍යාපෘති වියදම් සමඟ සෘජුව සම්බන්ධ නොවන බැවින් එම වියදම් භාණ්ඩාගාර ගිණුම්වලට ඇතුළත් කර එය වෙනම සටහනක් ලෙස හෙළිදරව් කරන ලදී. | බැඳීම් ගාස්තු සහ ණය පොළිය ව්‍යාපෘති වියදම් ලෙස ගිණුම් තැබිය යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ව්‍යාපෘති ඇගයුම් වාර්තාව, ඇමුණුම 5 හි 3 වගන්තිය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සවිස්තරාත්මක ව්‍යාපෘති අයවැයට අනුකූලව සවිස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සකස් කරනු ලැබිය හැකිය. එමෙන්ම, එක් එක් ක්‍රියාකාරකම් සඳහා මූල්‍යකරණ අවශ්‍යතා පැහැදිලිව සඳහන් කරනු ලැබිය හැකිය. ඒ අනුව, ව්‍යාපෘතිය මගින් 2023 වර්ෂය සඳහා සවිස්තරාත්මක අයවැයක් සකස් කර නොතිබුණි. | මුල් ව්‍යාපෘති සැලසුමට අනුව, වැඩසටහනේ සූදානම් වීමේ අදියරේදී සියලුම ව්‍යාපෘති සංරචක සඳහා සවිස්තරාත්මක පිරිවැය පත්‍රිකා පිළියෙළ කරන ලදී. කෙසේ වුවද, එක් එක් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් අපේක්ෂා කරන සේවාව සඳහා ජාත්‍යන්තර උපදේශකයින් බඳවා ගැනීම මත උප ක්‍රියාකාරකම් අවසන් කිරීම රඳා පවතින බැවින් 1 වන සංරචකය සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරකම් අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් සවිස්තරාත්මක ව්‍යාපෘති අයවැයට අනුකූලව සවිස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ආ) | 2009 | පොදු 287 ආකෘතියේ ස්ථාවර | ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් පිළිබඳ | පොදු 287 ආකෘතියෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | සැප්තැම්බර් 01 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009 (2) | වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | වාර්තා තබා ගැනීම සඳහා පොදු 198 ඉන්වෙන්ටරි ලේඛනය භාවිතා වේ. පොදු 198 ඉන්වෙන්ටරිය වෙනුවට අංක 287 දරන තොග ලේඛනය භාවිත කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/1/2019 | වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක්වත් පැවැත්වීම අවශ්‍ය වුවද, ව්‍යාපෘතිය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එම චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි රැස්වීම් 4ම ඉදිරියේදී පැවැත්වීමට කටයුතු සූදානම් කෙරේ. | කළමනාකරණ විගණන චක්‍රලේඛයට අනුව විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය |
| (ඈ) | අංක 8996LK දරන ණය ගිවිසුමේ උපලේඛන 2 හි 1 වන වගන්තිය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දින සිට මාස තුනකට නොඅඩු කාලයක් තුළ ව්‍යාපෘතිය මගින් ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක් ස්ථාපනය කළ යුතුය. ව්‍යාපෘතිය 2021 ඔක්තෝම්බර් 12 වන දින ආරම්භ කර තිබුණද, ඉහත අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2022 පෙබරවාරි 21 දිනැති අංක CResMPA/PD/NPOC/09 දරණ ලිපිය මගින් ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක් පිහිටුවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට දන්වා තිබුණි. අවශ්‍යතාවක් ඇති වුවහොත්, වාරිමාර්ග අමාත්‍යාංශය විසින් සුදුසු පරිදි ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව කැඳවනු ලබයි. | ණය ගිවිසුමට අනුව, ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව නිසි පරිදි කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාද වීමට හේතු | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ඒකකය/ ප්‍රතිශතය | අත්පත් කර ගත් කාර්යසාධනය ඒකකය/ ප්‍රතිශතය | | | |
| (අ) 01 සංරචකය | අධි බලපෑම් සහිත කාලගුණය, ගංවතුර සහ නායයෑම් පිළිබඳ | 90 | 50 | අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත කාර්යසාධනය ලබා ගැනීමට ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන නියෝජිතායතන සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල තනතුරු 2024 ජනවාරි වන තෙක් කළමනාකරණ සේවා | සැලසුම් කර ඇති පරිදි, එක් එක් සංරචකය යටතේ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පුරෝකථනය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම. | | | අසමත් විය. ලබා ගත් මූල්‍ය කාර්යසාධනය සියයට 29.7ක් පමණි. | දෙපාර්තමේන්තුව මගින් අනුමත නොකළ බැවින්, IAs හි කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් යොමු කිරීම් අනුදේශ (TOR), පිරිවිතර, ටෙන්ඩර් ලේඛන සහ අවශ්‍ය ලියකියවිලි සකස් කිරීම සැලකිය යුතු අන්දමින් ප්‍රමාද විය. | සියලුම ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 02 සංරචකය | අඹතලේ ලවණතා බාධක ඉදිකිරීම සහ සූදානම් කිරීමේ අධ්‍යයන | 63 | 32 | ව්‍යාපෘතිය අඹතලේ ලවණතා බාධකය ඉදිකිරීමට අපොහොසත් වී ඇති අතර ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම්වල භෞතික කාර්යසාධනය ලබා ගෙන ඇත. | 2022 මැද භාගයේදී අයවැය ඇස්තමේන්තු සකස් කර භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන අවස්ථාවේ දී, 2023 මැද භාගය වන විට සැලසුම් සමාලෝචනය සහ අධීක්ෂණ උපදේශනය ප්‍රදානය කළ හැකි යැයි උපකල්පනය කරන ලදී. එබැවින්, ලබා දෙනු ලබන උපදේශන සඳහා ගෙවීම් කිරීමට සහ 2023 අග භාගයේදී ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවෙකු සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීමට ප්‍රමාණවත් අයවැයක් වෙන් කරන ලදී. | -එම- |
| (ඇ) 01,02,03 සහ 05 සංරචක | අධි බලපෑම් සහිත කාලගුණය, ගංවතුර සහ නායයෑම් පිළිබඳ පුරෝකථනය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම, අඹතලේ ලවණතා බාධක ඉදිකිරීම සහ සූදානම් කිරීමේ අධ්‍යයනය, දේශගුණික ඔරොත්තු දීමේ | 81 | 51 | ව්‍යාපෘතිය සඳහා මුළු ඇස්තමේන්තුව රු.මිලියන 2,025ක් වුවද, සමාලෝචිත වර්ෂයේ දී වැය කර තිබුණේ රු. මිලියන 601.2ක් පමණි. ඒ අනුව, ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය සියයට 29.68 කි. | පැහැදිලි කළ පරිදි, PCT සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා නොදීම, IA සඳහා කාර්ය මණ්ඩල තනතුරු නිර්මාණය කිරීමට අනුමැතිය ලබා නොදීම, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජල කාලගුණ විද්‍යා ජාලය නවීකරණය කිරීම, ලවණතා බාධකය ඉදිකිරීම සඳහා අවසාන සැලසුමක් සකස් කිරීම සඳහා සැලසුම් සමාලෝචනය සහ අධීක්ෂණ උපදේශක බඳවා ගැනීම, වී | -එම- |

| | |
|---|---|
| හැකියාව වැඩි දියුණු කිරීම සහ වාරිමාර්ග හා වැසි ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම. | ඔය ජලාශයේ සවිස්තරාත්මක සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර උපදේශකයෙකු බඳවා ගැනීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා පෙර සූදානම සහ ප්‍රතිචාර පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා උපදේශකවරයෙකු බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා නොදීම සහ ද්‍රව්‍ය හිඟය සහ ඉන්ධන මිල ඉහළ යාම හේතුකොටගෙන ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල පෙරනොවූ විරු අන්දමින් ඉහළ යාම හේතුවෙන් ප්‍රධාන ඉදිකිරීම් කටයුතු ප්‍රදානය කිරීමට ඉඩ නොදීම 2023 වර්ෂයේ දී සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම සඳහා හේතු විය. එමගින් අපේක්ෂා කළ පරිදි වියදම් ගෙවීමට හා භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි විය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය රු. මිලියන 601.2ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත 5 වැනි සංරචකය යටතේ ලබාදී තිබුණු රු. මිලියන 97.19ක මුදල් අත්තිකාරම එයට ඇතුළත් කර තිබුණි. | සඳහන් කර ඇති පරිදි, රු. මිලියන 601.2ක් ව්‍යාපෘති කටයුතු සඳහා ලබා දී ඇති අතර එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සංරචක 5 යටතේ ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් පැකේජ සඳහා වන අරමුදල් CP, RFQ සහ DC පැකේජ සඳහා අත්තිකාරම් ගෙවීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හරහා PCT වෙත ඉදිරිපත් කරන ලද බිල්පත්වල කොටසක් ගෙවීම් සඳහා එම මුදලට සමාන මුදලක් දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාල වෙත මුදා හැර ඇත. | අදාළ කාලසීමාව තුළ අදාළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමටත්, අත්තිකාරම් කඩිනමින් පියවීමටත් අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.3 ක්ෂේත්‍ර පරික්ෂාවන්හි දී අනාවරණය වූ නිරික්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි විශාල, මධ්‍යම හා කුඩා වාරිමාර්ග පද්ධතිවල හදිසි ප්‍රතිසංස්කරණ කටයුතු ගොවි සංවිධානවල සෘජු මැදිහත්වීම සහ ග්‍රාමීය හා ප්‍රාදේශීය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදුකිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය සැලසුම් කර තිබුණි. ඒ අනුව මාස 18ක කාලයක් තුළ එ.ජ.ඩො. මිලියන 15ක වියදමින් මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට සැලසුම් කර තිබුණි. | | |
| | (i) කෙසේ වුවද, මාස 11කට පසුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැය කර තිබුණේ එ.ජ.ඩො. මිලියන 1.113ක් පමණි. ඒ අනුව, ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සියයට 7.42ක් පමණක් වූ අතර ඉදිරි මාස 7 තුළදී හඳුනාගත් ඉතිරි වැඩවලින් සියයට 92.58ක මූල්‍ය කාර්යසාධනයක් ලබා ගත යුතුය. | 2023 මැයි 28 වන දින 05 සංරචකය සක්‍රිය කරන ලද අතර, එම කාලය දක්වා ක්ෂේත්‍ර පරීක්ෂණය අවසන් කිරීම සහ ඇදීම් සහ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සූදානම් කිරීමේ කටයුතු සිදු කරන ලදී. කෙසේ වුවද, ව්‍යාපෘතිය සක්‍රිය කර 2023 ජූලි මාසයේදී බැංකුව විසින් නියැදි ටෙන්ඩර් ලේඛන සහ අදාළ මාර්ගෝපදේශ සකස් කර අවසන් කරන තෙක් ටෙන්ඩර් ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි. එබැවින් කොන්ත්‍රාත් ප්‍රදානය සම්පූර්ණ කිරීමට සහ මෙම කාලය තුළ ඉදිකිරීම් අවසන් කර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අත්පත් කර ගැනීමට 2024 දෙසැම්බර් දක්වා ප්‍රමාණවත් කාල සීමාවක් තිබේ. | ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | (ii) සමාලෝචිත වර්ෂය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ගොවි සංවිධාන වෙත රු. මිලියන 87ක වටිනාකමකට කොන්ත්‍රාත් පැකේජ 69 ක් ප්‍රදානය කර ඇත. කෙසේ වුවද, මඩකලපුව සහ අම්පාර ප්‍රදේශයේ සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාව අනුව ව්‍යාපෘතිය පිළිබඳ නිසි අධීක්ෂණයක් නොමැතිවීම හේතුවෙන් බොහෝ ඉදිකිරීම් වෙනත් පාර්ශ්ව විසින් සිදු කර ඇති බව අනාවරණය විය. කෙසේ වුවද, "දුගී ප්‍රජාවන්ට | PCT මගින් සකස් කරන ලද යෝජනාවට අනුව, සමාජ හා පාරිසරික ආරක්ෂාව සහතික කිරීම සඳහා මට්ටම් කිරීම, මැනීම, බිල්පත් සකස් කිරීම සහ ESCOP ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරීන් විසින් FO බලගැන්වීමට සැලසුම් කරන ලදී. කෙසේ වුවද, CP පැකේජ ක්‍රියාත්මක කිරීම FO හි වගකීම වේ. මේ සම්බන්ධයෙන් යම් යම් අපගමනයන් අනාවරණය වුවහොත්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා | සැලසුම් කළ ආකාරයෙන් කටයුතු අධීක්ෂණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. අක්‍රමිකතා ඇත්නම් අදාළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ඔවුන්ගේ ඇළ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට සහාය වෙමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට උපකාර කිරීම" යන මූලික අරමුණ ඉටු වී නොතිබුණි. | අදාළ තාක්ෂණික නිලධාරීන්ට උපදෙස් ලබා දී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා පියවර ගනු ලැබේ. | |

### 3.4 නිෂ්ක්‍රීය / උපයෝජනය නොකළ / ඌනඋපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 වර්ෂය සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් වූ වාර්ෂික ඇස්තමේන්තුව යටතේ රු. මිලියන 2,025ක් වෙන් කර තිබුණද, එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 601.2 ක් (29.69%) පමණක් උපයෝජනය කර තිබුණි. සැලසුම් කළ කාලසීමාව තුළ සැලසුම් කර තිබුණු කටයුතු ඉටු කිරීම සඳහා නිසි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදනවලින් සියයට 70.31 ක ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණි. | 2022 වර්ෂයේ දී සකස් කර අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද වැඩ සැලැස්ම ක්‍රියාවට නැංවීමේ අපේක්ෂාවෙන් අයවැය ඇස්තමේන්තු මගින් ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 2,025 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. සඳහන් කර ඇති පරිදි, 2022 වර්ෂය තුළ මෙන්ම 2023 වර්ෂය තුළද ව්‍යාපෘති කටයුතුවල ඉතා මන්දගාමී ප්‍රගතියක් දක්නට ලැබුණි.. | සැලසුම් කර ඇති පරිදි, එක් එක් සංරචක යටතේ සියලුම ක්‍රියාකාරකම් අවසන් කිරීමටත්, නියමිත කාලසීමාව තුළ අරමුදල් නිසි ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ii) | වසර 5ක කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 92ක් වෙන් කළද, පසුගිය වර්ෂ දෙක තුළ එ.ජ.ඩො. මිලියන 2.23ක් (2.5%) ක් පමණක් උපයෝජනය කර තිබුණි. | සඳහන් කර ඇති පරිදි, 2023 වර්ෂය දක්වා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය ඉතා පහළ මට්ටමක පැවතිණි. ඉහත සඳහන් ගැටළු ව්‍යාපෘති කළමනාකාරීත්වය විසින් මනාව විසඳා ඇත. 2023 දෙසැම්බර් මාසයේදී පවත්වන ලද ලෝක බැංකු ක්‍රියාත්මක කිරීමේ සහාය මෙහෙයුම සහ 2024 මැයි මාසයේදී පවත්වන ලද පසු විපරම් පූර්ව MTR මෙහෙයුම සමඟ ඇති කර ගත් එකඟතාවයට අනුව, එ.ජ.ඩො. මිලියන 51 දක්වා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සඳහා ද, එ.ජ.ඩො. මිලියන 19 දක්වා විය පැහැදම් ගෙවීම සඳහා ද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම විධිමත් කර ඇත. | ව්‍යාපෘති කාල සීමාව තුළ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (iii) | ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් (IBRD) ව්‍යාපෘතිය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,364ක මුදලක් ලබා ගෙන තිබුණද, එම කාලපරිච්ඡේදය තුළ වැය කර ඇත්තේ රු.මිලියන 676ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස, රු.මිලියන 785ක මුදලක් භාවිත නොකර මාස 7ක් පුරා එම ගිණුමේ නිෂ්ක්‍රීයව තැන්පත් කර තිබුණි. | සඳහන් කර ඇති පරිදි, මහ බැංකුවේ නම් කරන ලද ගිණුමේ වසර අවසාන ශේෂය රු. මිලියන 784 කි. ණය ගිවිසුමට අනුව, ඉදිරි මාස 6 සඳහා පුරෝකථනය කරන ලද ව්‍යාපෘති වියදම් පියවා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටිය හැකි අතර එය ව්‍යාපෘති කළමනාකරණය සඳහා ලෝක බැංකුව විසින් නම් කළ ගිණුම මගින් සපයනු ලබන පහසුකමකි. ඒ අනුව, සෑම වසරකම අවසානයේ ඉදිරි මාස කිහිපය සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය නම් කළ ගිණුමේ ශේෂයක් ලෙස පවතී. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ලබා දෙන අරමුදල් ආර්ථික වශයෙන් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපයෝජනය කිරීමට යොමු කළ යුතුය. |

## 3.5 පද්ධති සහ පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ණය ගිවිසුමේ ඇමුණුම 2 හි 1 වැනි වගන්තියට අනුව, ක්‍රියාත්මක වන දින සිට මාස හයකට නොඅඩු කාලයකට පසුව, ව්‍යාපෘතිය වැඩිදියුණු කර ක්‍රියාත්මක කළ යුතු වුවද, බැංකුවට පිළිගත හැකි මෙහෙයුම් මූල්‍ය කළමනාකරණ මෘදුකාංගයක් සකස් කර නොතිබුණි. කෙසේ වුවද, CRIP ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 7.4ක වියදමින් මිලදී ගත් ගිණුම්කරණ මෘදුකාංගය භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමට ව්‍යාපෘතිය මගින් අවධානය යොමු කර නොතිබුණි. | CRIP ව්‍යාපෘතිය සඳහා ගිණුම් පද්ධතියක් ඇතුළු කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) රු. මිලියන 7.4 ක වියදමක් දරමින් සංවර්ධනය කරන ලද අතර එය හුදෙක්ම ව්‍යාපෘති කළමනාකරණ අරමුණු සඳහා ලෝක බැංකුව සමඟ එකඟ වූ ප්‍රධාන අවශ්‍යතාවයන්ගෙන් එකක් වේ. එමෙන්ම එය ලෝක බැංකුව මගින් මූල්‍යකරණය කරනු ලබන සියලුම ව්‍යාපෘති සඳහා ප්‍රායෝගිකව සිදු කරනු ලබන අනිවාර්ය අවශ්‍යතාවකි. | ගිණුම්කරණ මෘදුකාංගය භාවිතයට ගත යුතුය. |